රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 5/97(II)

මගේ අංකය : එක්ස්ටියු/2(III)/7
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1998.12.30 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**රජයේ නිලධාරීන් සඳහා රක්ෂණ ක්‍රමයක්**
**ඇති කිරීම (අග්‍රහාර)**

ඉහත කරුණ ගැන 1997.01.31 දතම දරන අංක 05/97 හා 1997.09.01 දතම දරණ 05/97(I) චක්‍රලේඛවලට අමතර වශයෙනි.

02. අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග එකගතාවයකට පත්ව ඇති අතර, ඒ අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

1. සාමාන්‍ය දරු උපතක් සඳහා

(අ) රජයේ රෝහලක නේවාසිකව සිටියේ නම්, දිනකට රු. 250/- බැගින් වූ ගාස්තුවක් රෝහල්ගතව සිටි දින ගණන අනුව ගෙවනු ලැබේ. මෙම ගෙවීම රු. 3000/- ක උපරිමයකට යටත් වේ.

(ආ) පෞද්ගලික රෝහලක නේවාසිකව සිටියේ නම් දිනකට රු. 250/- බැගින් වූ ගාස්තුවක් හෝ රෝහල්ගතව සිටි දින ගණනට අදළව බිල්පතේ සඳහන් ගාස්තුව හෝ ගෙවනු ලැබේ. මෙම ගෙවීම රු. 3000/- ක උපරිමයකට යටත් වේ.

03. විශේෂඥ අක්ෂි වෛද්‍යවරයකු විසින් නිකුත් කරනු ලබන සහතිකවලට හැර වෙනත් සහතිකවලට ලබා ගෙන ඇති ඇස් කණ්නාඩි සඳහා මුදල් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

04. බාහිර ප්‍රතිකාර ලබා ගැනීමකින් හෝ රෝහල් ගතවීමකින් පසු දින 90 ක් ඇතුලත අදළ හිමිකම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියමිත කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

05. රජයේ නිලධාරීන්ගේ රක්ෂණ ක්‍රමය පිළිබඳ කටයුතු ඉටු කිරීමේදී තවමත් ප්‍රමාදයන් සිදුවන බවට පැමිණිලි ලැබෙන හෙයින්, එම තත්ත්වය වළක්වාලීමට පියවර ගත යුතුය.

අ.කලේ පී.ඒ.සේනාරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය